# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2051/42 - 2017 දෙසැම්බර් මස 29 වැනි සිකුරාදා - 2017.12.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත

**4 (2) උප වගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ අරමුණ සඳහා 2018 ජනවාරි 01 දින සිට බලාත්මක කරන අතුරු මූල්‍ය ප්‍රකාශවල සංඛ්‍යා මත විකල්ප සලකන ආකාරය පිළිබඳ ප්‍රකාශය (SoAT) ආයතනය විසින් සම්මත කර මේ සමග පළකර ඇත. මෙම SoAT වර්ෂ දෙදහස් දහඅටේ ජනවාරි පළමු දින හෝ ඊට පසු ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශ සඳහා බලාත්මක කළ යුතුය. කලින් ව්‍යවහාර කිරීමට අවසර ඇත.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2017 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**අතුරු මූල්‍ය ප්‍රකාශවල සංඛ්‍යා මත විකල්ප සලකන ආකාරය පිළිබඳ ප්‍රකාශය (SoAT)**

**පූර්විකාව**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව. අස්තිත්ත්වයන් අතුරු මූල්‍ය වාර්තාවක් ප්‍රකාශයට පත්කිරීමට තෝරාගත යුතු හෝ එසේ කිරීම අවශ්‍ය නම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 34 (LKAS 34) - *අතුරු මූල්‍ය වාර්තාකරණය* ව්‍යවහාර කරයි. LKAS 34හි 19 වැනි ඡේදයේ වගන්ති අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල සියළුම අවශ්‍යතාවයන් සමඟ අනුකූල වන්නේ නම් හැර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූල වීමක් ලෙස අතුරු මූල්‍ය වාර්තාවක් විස්තර නොකළ යුතුයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 (SLFRS 9) **-** *මූල්‍ය සාධනපත්‍ර*, 2018 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා බලපැවැත්වේ. ඒ අනුව අතුරු ප්‍රතිඵල වාර්තා කිරීමේදී, අස්තිත්වයන් SLFRS 9 ව්‍යවහාර කිරීම අවශ්‍ය වන අතර ඒ සමඟ අනුකූල විය යුතුයි. කෙසේ නමුත් ප්‍රායෝගික නොවන්නේ නම්, මුලින් ව්‍යවහාර කරන දිනට පෙර අතුරු කාලපරිච්ඡේද වලට මෙම ප්‍රමිතයේ අවශ්‍යතාවයන් අස්තිත්වයන්ට ව්‍යවහාර නොකිරීමට SLFRS 9හි 7.2.16 ඡේදයෙන් අවසර දේ.

SLFRS 9 සුමටව ක්‍රියත්මක කිරීමට අතිරේක කාලයක් සපයන 2018 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන පළමු මූල්‍ය වර්ෂය තුලදී අතුරු මූල්‍ය ප්‍රකාශවලට සහනයක් සඳහා බොහෝ අස්තිත්වයන් මඟින් එවූ ඉල්ලීම් කිහිපයක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කමිටුවට ලැබී තිබේ. 2012 අවසානයේ සිට මෙම ප්‍රමිතයේ පළමු කොටස නිකුත් කිරීම නිසා, මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය නියාමකයන් සමඟ නොකඩවා සාකච්ඡා කර තිබුණි.

**නිර්දේශය**

2018 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන මූල්‍ය වර්ෂය තුලදී SLFRS 9 ව්‍යවහාර කර තිබේ නම් කාලපරිච්ඡේද සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශයට වන බලපෑම මත හෙළිදරව් කිරීම් සමග LKAS 39 -*මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම සහ මැනීම* අඛණ්ඩව ව්‍යවහාර කරමින් අතුරු මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වන විකල්පයට ඉඩ දීමට වරලත් ගණකාධිකාරි ආයතනය තීරණය කර තිබුණි. එම බලපෑමේ නිර්ණය කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් එම කරුණ හෙළිදරව් කළ යුතුයි.

ඒ අනුව 2018 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන මූල්‍ය වර්ෂය තුලදී අතුරු මූල්‍ය ප්‍රකාශ වල තුලනාත්මක සංඛ්‍යා සඳහා SLFRS 9හි 7.2.16 ඡේදයේ සඳහන් නිදහස් වීම ව්‍යවහාර කිරීම සඳහා අස්තිත්වයන්ට තීරණය කළ හැකියි.

කෙසේ වුවද 2018 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී SLFRS 9 ව්‍යවහාර කිරීමට අස්තිත්වයන් අවශ්‍ය වේ.

08-955

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.